## කාර්ය පත්‍රිකා

**නිපුණතාව 1 .0 : කලාව යන්න විමසමින් නාට්‍ය හා රංගකලාව අනෙකුත් කලා සමඟ සංසන්දනය කරයි.**

**නිපුණතා මට්ටම 1.1 : කලාව යන්න නිර්වචනය කර වර්ගීකරණයට ලක් කරයි.**

**ක්‍රියාකාරකම : "කලාව" යන්න හඳුනා ගනිමු.**

සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

1. ජන කලා සම්බන්ධ සාවද්‍ය ප්‍රකාශය වන්නේ,
   i. ගැමි කලා යනුවෙන්ද හඳුන්වනු ලැබේ.
   ii. ප්‍රාකෘතික කලාවන්ට වඩා යම් තරමින් මිනිස් චෛතන්‍යය සමඟ ආත්මීය බැඳියාවක් දක්වයි.
   iii. ජන කවි,ජන සංගීතය ,ජන නැටුම මේ ගණයෙහිලා සැලකේ.
   iv. මිනිසාගේ විඥානය පුළුල් කිරීමේ ශක්තියක් පවතී.
   v. නිර්මාණාත්මක හා ආස්වාදනීය ස්වභාවයකින් යුක්ත වේ.
2. කලාව ගුණාත්මක අංශය සළකා කෙරෙන වර්ගීකරණයට අයත් වේ.
   i. ජන කලා,ජනප්‍රිය කලා ,ලලිත කලා
   ii. ව්‍යවහරික කලා ,ජනප්‍රිය කලා ,ප්‍රාකෘතික කලා
   iii. ජන කලා,ප්‍රාකෘතික කලා ,ව්‍යවහරික කලා
   iv. ලලිත කලා ,ජනප්‍රිය කලා ,ප්‍රාකෘතික කලා
   v. ව්‍යවහරික කලා ,ජනප්‍රිය කලා ,ලලිත කලා

3. ලලිත කලා සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය වන්නේ,
   i. ප්‍රාග් ඓතිහාසික කලාව යනුවෙන් හඳුන්වයි.
   ii. පැරණි ජන සමාජවල බිහි වී වර්ධනය වූ සාහිත්‍යය , සංගීතය වැනි අංගයන්ය.
   iii. මටසිලුටු වූ ද මනස හා පරිකල්පනය සමඟ සම්බන්ධ කරගත් අදාළ මාධ්‍ය වඩා නිදහස්ව භාවිතා වන්නකි.
   iv. ස්වභාවික ලෝකයේ මතුපිට ලක්ෂණ කලා මාධ්‍යවල නොගැඹුරු ස්වරූප අනුකරණය කරන කලාවයි.
   v. වෙළඳපොල ඉල්ලුම වැඩි කර ගැනීමට කලා මාධ්‍ය යොදාගැනීමයි.
4. ලලිත කලා අයත් නිවැරදි වරණය වන්නේ,
   i. නාට්‍ය ,චිත්‍රපට,මූර්ති ,නර්තන
   ii. චිත්‍රපට ,ජන කවි,මූර්ති ,ගෘහ නිර්මාණ
   iii. නාට්‍ය ,චිත්‍ර ,චිත්‍රපට ,ජන නැටුම්
   iv. ජන කවි,නාට්‍ය ,ජන නැටුම් ,මූර්ති
   v. නර්තන ,සාහිත්‍ය ,ජන සංගීතය ,චිත්‍රපට

5. ව්‍යවහරික කලා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වන්නේ,
   i. පුළුල් අධ්‍යාත්මික ප්‍රකාශනයක් ඇතුළත් වේ.
   ii. මටසිලුටු හා සුඛනම්‍ය වේ .
   iii. වෙළඳපොල ඉල්ලුම සළකා භාණ්ඩ නිෂ්පාදනයෙහිදී කලාත්මක ලක්ෂණ යොදා ගැනීමකි.
   iv. ජනප්‍රිය කලා යනුවෙන් ද හැඳින්වේ.
   v. සාහිත්‍ය,නර්තනය ,නාට්‍ය මේ ගණයෙහිලා සැලකේ.

. කෙටි ප්‍රශ්න

1) සොකරි,කෝලම් අයත් වන්නේ කුමන කලා ගණයටද?
2) ලලිත කලා 3ක් නම් කරන්න.
3) ලලිත කලා හඳුනා ගැනීමේ නිර්නායකයන් දෙකක් ලියන්න.
4) “කලාව” යන්නට නිර්වචනයක් ලියන්න.
5) ජනප්‍රිය කලා සඳහා උදාහරණක් ලියන්න.

රචනා ප්‍රශ්න

1) කලාවෙහි ගුණාත්මක අංශය සළකා කෙරෙන වර්ගීකරණය විස්තර කරන්න.
2) ව්‍යවහරික කලා සහ ලලිත කලා අතර වෙනස්කම් පැහැදිලි කරන්න.
3) නාට්‍ය කලාවේ මූලික ලක්ෂණ විමසන්න.
4) නූතන ලෝකයෙහි ලලිත කලාව භාවිතය පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.